# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1520/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 05/12/2023 පැය 1330

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2023.12.05 වන අද දින උද්ඝෝෂකයින් පිරිසක් වැලිකඩ පොලිස් වසමේ පොල්දූව මංසන්දියේ සිට පාර්ලිමේන්තු ප්‍රවේශය දක්වා වූ මාර්ගය තුල පැවැත්වීමට නියමිත උද්ඝෝෂණයක් සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානාධිපතිට ලැබුණු තොරතුරු මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබිණි.

ඒ අනුව උද්ඝෝෂණයක් පැවැත්වුවහොත් මහජන පීඩාවක් ඇති විය හැකි බැවින්, වැලිකඩ පොලිස් වසමේ පොල්දූව මංසන්දිය සිට පාර්ලිමේන්තු ප්‍රවේශය දක්වා වූ මාර්ගය තුළ මහජන පීඩාවක් ඇති වන ආකාරයේ ක්‍රියාවන් සිදු කිරීම වළක්වාලමින් පහත සදහන් වගඋත්තරකරුවන් වෙත අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

වගඋත්තරකරුවන් -

01. ගුරු විදුහල්පති සමිති සංධානයේ ලේකම් ජෝශප් ස්ටාලින්,
02. ලංකා ගුරු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ
03. සමස්ථ ලංකා එක්සත් ගුරු සේවක සංගමයේ සභාපති යග්වෙල පඤ්ඤාසාර හිමි,
04. ශ්‍රී ලංකා ජාතික විදුහල්පති සංගමයේ සභාපති මොහාන් වීරසිංහ,
05. විදුහල්පති සේවා සංගමයේ සභාපති සුනිල් ප්‍රේමතිලක
06. ඒකාබද්ධ ගුරු සේවක සංගමයේ ලේකම් සංජීව බණ්ඩාර,
07. ලංකා ප්‍රගිත ගුරු සංගමයේ ලේකම් මයුර සේනානායක,
08. ස්වාධීන අධ්‍යාපන සේවක සංගමයේ සභාපති ජගත් ආනන්ද සිල්වා

සහ වෙනත් තැනැත්තන්,

මෙම ආඥාව කඩ කිරීම ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බවට ආඥාව මඟින් දැනුම්දී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**